ලංකා රෙස්ට් හවුසස් සමාගම - 2018
-----------------------------------------

**1.1** මතය ප්‍රකාශනය
-----------------

ලංකා රෙස්ට් හවුසස් සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ප්‍රකාශනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2** මතය ප්‍රකාශනය සඳහා පදනම
------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරිමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරිමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරිම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරිමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරිම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධින් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මුල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරිම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරිම් ඇතුළත් මුල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මුල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්,වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම් වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. චෙක්පත් ලිවීම හා ආකෘති පත්‍ර භාවිතය ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 225 (4) අනුව සියළුම ගෙවීම් වවුචර්පත් හරි වැරදි බලා කෙටි අත්සන් යෙදිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අඩුපාඩු නොවන පරිදි එම කටයුතු සිදුකිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |
| (ආ) | වවුචර්පත් අනුමත කිරීම් සහ සහතික කිරීම් වලට අදාල නිලධාරි වවුචර්පත් අත්සන් නොකල අවස්ථා දකින්නට ලැබුණි. එසේම ගෙවීම් ලාභියා විසින්ම ගෙවීම් වවුචර්පත් අනුමත කල අවස්ථා තිබුණි. | ඉදිරියේදී අඩුපාඩු නොවන පරිදි එම කටයුතු සිදුකිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී. | වවුචර්පත් අනුමත සහ සහතික කිරීම අවශ්‍යයෙන්ම කල යුතු අතර අභ්‍යන්තර වැඩ බෙදීමක් ඇතිකල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264 අනුව ගෙවීම් තහවුරු කරන බිල්පත්/රිසිට්පත් වවුචර්පත සමඟ අමුණා තැබිය යුතු වුවත් ගෙවීම් තහවුරු කිරීමේ ලේඛන නොමැති වවුචර් විගණනයේදී නිරීක්ෂණය විය. | ඉදිරියේදී අඩුපාඩු නොවන පරිදි එම කටයුතු සිදුකිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී. | මුදල් රෙගුලාසි 264 අනුව කටයුතු කල යුතුයි |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 225 (2) අනුව ගමන් වියදම් ගෙවීම සඳහා පොදු 177 ආකෘති පත්‍රය භාවිතා කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අඩුපාඩු නොවන පරිදි එම කටයුතු සිදුකිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී. | මුදල් රෙගුලාසි 225 (2) අනුව කටයුතු කල යුතුයි. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් සමාගම විසින් LKAS – 08 අනුව පෙර වර්ෂවල | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | LKAS – 08 අනුව ගිණුම් නැවත ප්‍රතිෂ්ඨාපනය කර ප්‍රමිතිය පරිදි මූල්‍ය |

| | | |
|---|---|---|
| වැරදි නිවැරදි කර ගිණුම් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ස්ථාවර නොවන වත්කම් ක්ෂය කිරීමේදී ක්ෂය ගණනය කිරීමේ ප්‍රතිපත්තිය අනුව කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුව දේපල පිරියත උපකරණ හීනවන ශේෂ ක්‍රමයට හෝ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කල යුතු අතර සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය වනුයේ සරල මාර්ග ක්‍රමයට ක්ෂයකිරීම බැවින් සමාගම විසින් දේපල පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම වෙනුවට හීන වන ශේෂ ක්‍රමය මත ක්ෂයකර තිබුණි. | ඉදිරියේදී සරල මාර්ග ක්‍රමයට ගණනය කර ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කරන්නේ නම් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතු අතර තෝරාගනු ලබන නව ප්‍රතිපත්ති වඩාත් තාත්වික විය යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදී දෛනිකව එක්රැස් වූ ආදායම් මුදලින් රු.1,327,585 ක මුදලක් ලංකා රෙස්ට් හවුසස් සමාගමේ ආදායම් එක්රැස් කිරීමේ ගිණුමේ තැන්පත් නොකර එම මුදල් තානායමේ දෛනික වියදම් සඳහා වැයකර තිබුණි. ඒ අනුව මහියංගන තානායම සම්බන්ධයෙන් ආදායම් හා වියදම් ක්‍රමානුකූල හා විධිමත්ව ගිණුම්ගත කර තිබේද යන්න විගණනයේදි තහවුරු කරගත නොහැකි විය. | 2018 ඔක්තෝම්බර් මස සිදුවූ දේශපාලන වෙනස්වීම් හේතුවෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරීත්වය ක්‍රියාත්මක නොවන තත්ත්වයට පත්විය. එම හේතුවෙන් සමාගමේ සභාපතිවරයකු නොසිටි බැවින් අදාල වියදම් අනුමැතියට නිසි බලධාරියෙකු නොමැතිවීම නිසා මෙම වියදම් ගිණුම්ගත නොකරන ලදී. සමාලෝචිත ගිණුම් වර්ෂයට පසුව අනුමත කර ගිණුම්ගත කරන ලදී. | දෛනිකව එක්රැස්වන ආදායම් වියදම් සඳහා කිසිදු අයුරකින් භාවිතා නොකල යුතුය. |
| (ආ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාගමේ ස්ථාවර තැන්පතුවල ශේෂය රු.38,289,868 ක් සහ එයට අදාල පොලි ආදායම රු.3,088,826 ක් වුවද විගණනයේදි කරන ලද ගණනය කිරිම් අනුව එම ශේෂයන් පිළිවෙලින් රු.37,423,969ක් සහ රු.3,963,646 ක් බව නිරීක්ෂණය විය. | දෝෂ නිවැරදි කිරිමට 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරිමේදී කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී වෙනස්කම් සඳහා ගැලපීම් කර නිවැරදි ශේෂ යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිරි වර්ෂයේදි කල්පිරෙන ස්ථාවර තැන්පතු පොලී ආදායමෙන් අදාල සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොලි ආදායම වන රු. **2,356,843** ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදි කිරිමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණයගැතියන්ගේ රු. **5,786,327** ක් වු ශේෂය සඳහා සනාථන ලිපි ලැබී නොතිබුණි. | ඉදිරියේදී ශේෂය තහවුරු කර ගැනීමේ ලිපි යොමුකර විගණනය වෙත වාර්තා කිරිමට කටයුතු කරනු ඇත. | ණයගැති සනාථ ලිපි ලබාගැනීමට කටයුතු කල යුතුයි |
| (ආ) | එකතුව රු. **4,836,103** ක්වු ලැබිය යුතු ශේෂය වර්ෂ **5** කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුනු අතර එකී ශේෂ තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ලිඛිත විගණන සාක්ෂි නොතිබුණි. | ඉදිරියේදී ශේෂය තහවුරු කිරිමට කටයුතු කරනු ඇත. | දිගුකාලයක් නිරවුල් නොවි පැවතුණු ශේෂ සඳහා සනාථ කිරිම ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ණය හිමියන්ගේ රු. **13,467,486** ක් වන ශේෂයට සනාථන ලිපි ලැබී නොතිබුණි. | ඉදිරියේදී ශේෂය තහවුරු කිරිමට කටයුතු කරනු ඇත. | ණය හිමියන්ගේ වගකීම් සනාථ කරගත යුතුය. |
| (ආ) | එකතුව රු.**2,638,162** ක්වු ගෙවිය යුතු ශේෂ දිගුකාලයක් තුල නිරවුල් නොවී පැවතුණි. | ඉදිරියේදී ශේෂය තහවුරු කිරිමට කටයුතු කරනු ඇත. | දිගුකාලයක් නිරවුල් නොවී පවතින ශේෂ සනාථ කරගත යුතු අතර තවදුරටත් වගකීමක් නොමැති ශේෂ ආදායමට ලියාහැරිය යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රිති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි **177** | දෛනික ආදායම් සෑමවිටම අප්‍රමාදව බැංකුගත කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබීම. | **2019** අගෝස්තු මස සිට දෛනික ආදායම්, වියදම් සඳහා උපයෝගී කර නොගන්නා ලෙසද පෙරදින දෛනික ආදායම් පසුදින පෙ.ව.**10** වන විට බැංකුවේ | දෛනික ආදායම් අප්‍රමාදව බැංකු ගතකල යුතුය. |

| | | |
|---|---|---|
| | තැන්පත් කරන ලෙස දන්වන ලදී. | |

**1.8 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි **446(2)** ඡේදය අනුව මුදල් පොත ලැබීම් හා ගෙවීම් දින අනුපිළිවෙල සටහන් කර පවත්වාගත යුතු වුවද එසේ මුදල් පොත් පවත්වාගෙන නොතිබුණි. එසේම, දිනපතා මුදල් පොතේ මුළු ලැබීම් සහ මුළු ගෙවීම් වෙන් වෙන්ව සටහන් කර තුලනය කලයුතු වුවත් සමාගම විසින් පවත්වාගෙන ගිය මුදල් පොතේ දිනපතා හෝ මාසිකව තුලනය කර නොතිබුණි. එසේම අවම වශයෙන් වර්ෂ අවසානයේදී හෝ මුදල් පොත් තුලනය කර තබාගත යුතු වුවත් විගණන අවස්ථාව වන විටද එලෙස කටයුතු කර නොතිබුණි. | මෙතෙක් දිනපතා මුදල් පොත තුලනය කිරිමක් කර නොමැති අතර ඉදිරියේදී එම වරද නිවැරදි කිරිමට උපදෙස් ලබාදෙන ලදී. | මුදල් රෙගුලාසි **446(2)** ඡේදය අනුව මුදල් පොත පවත්වාගෙන යා යුතු බවටත් එසේම දිනපතා තුලනය කල යුතුය. |
| (ආ) | චෙක්පත් අනුපිළිවෙලට නිකුත් නොකිරීම සහ අවලංගු කල චෙක්පත් සම්බන්ධයෙන් නිසි පරිදි ලේඛනයක් නඩත්තු නොකිරීම නිසා චෙක්පත් අස්ථානගතවීමට ඇති ඉඩකඩ විගණනයේදී බැහැර කල නොහැකි කරුණක් වී තිබුණි. | අගරු චෙක්පත් සඳහා ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. | අගුරු චෙක්පත් ලේඛනයක් පවත්වාගත යුතු අතර චෙක්පත් නිකුත් කිරිමේදී අනුපිළිවෙලට නිකුත් කල යුතුය. |
| (ඇ) | සමාගම විසින් අත්තිකාරම් ලබාදීම්, පියවීම් සටහන් කිරීම සඳහා විධිමත් අත්තිකාරම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | **2018** වර්ෂයේ අත්තිකාරම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අත්තිකාරම් සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් පවත්වාගත යුතුයි. |
| (ඈ) | වර්ෂයටම අදාලව වර්ෂ අවසානයේදී එක් බැංකු සැසඳුම් ප්‍රකාශයක් පමණක් පිළියෙල කර තිබු අතර එම සැසඳුම් ප්‍රකාශයේද සැසඳුම පිළියෙල කල දිනය පරික්‍ෂා කල දිනය හා සහතික කල දිනය සටහන් නොවීම හේතුවෙන් සැසඳුම පිළියෙල කරන ලද දිනය තහවුරු කරගත නොහැකි විය. | **2019** වර්ෂයේ සිට මාසිකව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර බලයලත් නිලධාරින් දෙදෙනෙකු විසින් අත්සන් කිරිමට කටයුතු කර ඇත. | මාසිකව බැංකු සැසඳුම් පිළියෙල කල යුතු අතර එසේ පිළියෙල කළ නිලධාරින් සහ නිවැරදි බව පරික්‍ෂා කළ නිලධාරීන්ගේ අත්සන් සහතික කළ යුතු වේ. |
| (ඉ) | මු.රෙ.**395** (ඊ) ඡේදය පරිදි මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරිම සම්බන්ධයෙන් යම් ප්‍රමාදයක් වන්නේ නම් වගකිව යුතු නිලධාරියා විසින් ගණන්දීමේ නිලධාරියා වෙත දැනුම් දිය යුතු අතර, එබඳු ප්‍රමාදවීම් නැවත සිදුවීම වළක්වාලීම පිණිස කටයුතු කල යුතු වුවත් එබඳු ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගමේ වගකිව යුතු නිලධාරින් කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | මු.රේ.**395** පරිදි අප්‍රමාදව මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කල යුතුයි. |
| (ඊ) | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරිමේදී, **2018** | දිනපතා මුදල් පොත තුලනය | බැංකු සැසඳුම් ප්‍රකාශ |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව බැංකු ශේෂය ලෙස රු. 5,071,094.36 ක් ලෙස වාර්තා කර තිබුණද වර්ෂය පුරාම කිසිදු දිනක මුදල් පොත තුලනය කර නොතිබුණි. එසේම 2018 දෙසැම්බර් 31 දිනටද මුදල් පොත තුලනය කර නොතිබුණි. | කිරීමක් සිදුකර නොතිබුණු අතර මේ වන විට එකී වැරැද්ද නිවැරදි කිරීමට කටයුතු කර ඇත | නිවැරදිව පිළියෙල කිරීම සහ දිනපතා මුදල් පොත් තුලනය කිරීම කල යුතුයි. |
| (උ) | ලංකා රෙස්ට් හවුසස් ලිමිටඩ් මගින් ඍජුවම කළමනාකරණය කරනු ලබන මහියංගනය තානායම සඳහා, වෙනමම බැංකු ගිණුමක් ආරම්භ කර තිබූ අතර 2018 ජුනි මාසයේ සිට වර්ෂය අවසානය දක්වාම එකී බැංකු ගිණුම් සම්බන්ධයෙන් ද බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මහියංගන තානායමේ කටයුතු සඳහා ආරම්භ කරන ලද බැංකු ගිණුම සම්බන්ධයෙන් මාසික බැංකු සැසඳුම් පිළියෙල කල යුතුයි. |
| (ඌ) | මහියංගනය තානායමෙහි බැංකු ගිණුම් සඳහා 2018 මැයි මස පිළියෙල කරන ලද බැංකු සැසඳුම් විස්තරය අනුව රු.658,293.94 ක ඌණ තැන්පතු මුදලක් නිරීක්ෂණය විය. මෙම ඌණ තැන්පතු මුදල තානායමේ එවකට සිටි කළමනාකරු විසින් දෛනිකව ලද ආදායම බැංකු ගතකර නොතිබූ මුදලක් වන අතර එම කළමනාකරු සේවයෙන් ඉවත් වී තිබුණද මේ දක්වා මෙම ඌණ තැන්පත් මුදල අයකරගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | අයකරගැනීම සඳහා දැනුම් දී ඇත. | ලංකා රෙස්ට් හවුසස් සමාගම සිදුවූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ට විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ඌන තැන්පතු මුදල් අයකරගැනීමට වහාම කටයුතු කල යුතුයි. |
| (එ) | සමාගම විසින් නිකුත් කරන ලද මාස 06 ඉක්මවන ලද රු. 18,308.58 ක් වටිනා චෙක්පත් දෙකක් සම්බන්ධයෙන් මු.රෙ.396 පරිදි කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396 අනුව නිවැරදි කිරීම් හා ගැලපීම් ඉදිරියේදී කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | මාස 06 ක ඉක්මවන ලද චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කල යුතුයි. |
| (ඒ) | සමාගම වෙත ලැබී වර්ෂ අවසානයේදී බැංකුවේ තැන්පත් නොකල හෝ උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධනේ මු.රෙ.395 ප්‍රකාරව වාර්තාවක් හෝ ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් ලේඛනයක් සකස් කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | මුදල් රෙගුලාසි 395 ප්‍රකාරව ලේඛනයක් පිළියෙල කල යුතු වේ. |
| (ඕ) | ලංකා රෙස්ට් හවුසස් සමාගම විසින් තානායම් බදුදීමෙන් උපයාගන්නා බදුකුලී ආදායමෙන් සමාගමේ වියදම් හා පරිපාලිත ගාස්තු අඩුකර නගරසභා වැනි පළත්පාලන ආයතන වලට ගෙවිය යුතු රු. 22,344,990 ක්වූ ශේෂය තුල වසර 07 කටත් වඩා වැඩි ශේෂයන්ද පැවති බව නිරීක්ෂණය විය. | අදාල හිඟ මුදල් කඩිනමින් ගෙවන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් දෙන ලදී. | පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු මුදල් කඩිනමින්ම ගෙවා දැමිය යුතුයි. |

**1.9** බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අංක 83 වගන්තිය අනුව උපයන විට ගෙවීමේ බදු සෑම මාසයකම ඊළඟ මාස 15 දින හෝ එදිනට පෙර ගෙවිය යුතු වුවත් රු. 320,142 ක් වටිනා උපයන විට බදු වටිනාකම සමාගම විසින් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීමට කටයුතු කර නොමැත. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 83 වගන්තිය අනුව උපයන විට ගෙවීම් සෑම මාසයකම 15 දින හෝ ඊට පෙර ගෙවීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල උපයන විට ගෙවිය යුතු බදු වාර්තාව ඊළඟ වර්ෂයේ අප්‍රේල් මස 30 දින හෝ එදිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි. | ගෙවීමට කටයුතු කර නොමැත. | සේවකයින්ගෙන් කපාගත් උපයන විට බදු ගෙවීම් වාර්තාව සෑම වසරකම අප්‍රේල් 30 දිනට පෙර යැවිය යුතුයි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 8.37 බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ බදුපෙර ලාභය රු.10.98 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2.6 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු. මිලියන 1.8 කින් අඩුවීමද පරිපාලන වැය රු.2.3 කින් වැඩිවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම් සංරචකය | 2018 | 2017 | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| තානායම් ආදායම් | 5,509,751 | 7,037,668 | 1,527,917 | 21% |
| දඩමුදල් | 1,475,377 | 823,727 | 651,650 | 79% |

(I) සමාගමේ ප්‍රධාන ආදායම් සංරචකයක් වූ තානායම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.1,527,917 ක් අඩුවී තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 21 කි.

(II) දඩ මුදල් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව පවත්නා වර්ෂයේදී රු.651,650 ක් වැඩි වී තිබු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 79 කි.

(III) දඩ මුදල් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබීමෙන් තානායම් ආදායම් ලැබිය යුතු නිශ්චිත දිනයේදී නොලැබෙන බවත් එමඟින් දඩ ආදායම් වැඩි වී ඇති බවත් නිරීක්ෂණය වේ.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ සමාගමේ ඇතැම් වැදගත් අනුපාත ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාතය | වර්ෂය | |
|---|---|---|
| | 2018 | 2017 |
| දල ලාභ ආන්තිකය (ප්‍රතිශතය) | 94.58 | 90.36 |
| ශුද්ධ ලාභ ආන්තිකය (ප්‍රතිශතය) | 23.38 | 30.62 |
| ජංගම අනුපාතය (වාරගණන) | 0.66:1 | 0.53:1 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(I) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ආදායම රු.මිලියන 1.8 ක් අඩුවී තිබුණද විකුණුම් පිරිවැය රු.1.4 ක් එනම් සියයට 46 න් අඩුවීම හේතුවෙන් 2017 වර්ෂයේ 90.36 ක් වූ දළ ලාභ අනුපාතය 2018 දී 94.58 දක්වා වැඩිවී තිබුණි.

(II) පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම රු.මිලියන 2.26 න් වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ සියයට 30.6 ක්වූ ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 23.38 දක්වා පහල ගොස් තිබුණි.

(III) ඉකුත් වර්ෂයේ සමාගමේ ජංගම අනුපාතය 053:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ 0.66:1 ක් දක්වා වර්ධනය වී පැවතියද ජංගම අනුපාතය ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යාමට සමාගම අපොහොසත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය රු.2,159,023 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා සමාගම විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී දේපල පිරියත හා උපකරණ සඳහා ලේඛනයක් සකස් කිරිමට කටයුතු කරනු ඇත. | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කල යුතුයි. |
| (ආ) | තානායම් කළමනාකරණය | | |
| | 01. නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ලංකා රෙස්ට් හවුස් පුද්ගලික සමාගම නමින් රාජ්‍ය සමාගමක් ඇතිකර තානායම් | ඉදිරියේදී පුද්ගලික නම් වලට ලබානොදී සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ සමාගම් සඳහා පමණක් තානායම් | දීර්ඝකාලීන පදනම මත තානායම් බදු දීමේදී විනිවිදභාවයකින් යුක්තව ටෙන්ඩර් පරිපාටිය |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණය විධිමත් කිරිමට පියවර ගෙන තිබුණද එකී සමාගම විසින් නිශ්චිත ප්‍රතිපත්තියක් පදනම් කරගෙන දීර්ඝකාලීනව තානායම් බදුදීම සිදුකර නොතිබුණි. විශේෂයෙන්ම තානායම් බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර ලංසු කැඳවා ඉහල ලංසු ඉදිරිපත් කල සහ හෝටල් පවත්වාගෙනයාමේ පළපුරුද්ද සහ මුල්‍යමය ශක්තියක් ඇති පාර්ශවයන් හඳුනාගෙන තානායම් බදුදීමක් සිදුකර නොතිබීම. | කළමනාකරණය කිරිමට ලබාදීමට තීරණය කර ඇත. | අනුගමනය කර බදු දීමටත් එසේ බදු දීමේදී බදු ලබාගන්නා සමාගම්වල පළපුරුද්ද හා මුල්‍යමය හැකියාව පිලිබඳව වැඩි අවධානයක් යොමුකර බදුකරුවන් තෝරාගත යුතුයි. |
| 02. | තානායම් දීර්ඝකාලීනව බදු දිමේදී නිශ්චිත වර්ෂ ගණනාවකට බදුදිමේ ස්ථාවර ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබු අතර එක් එක් තානායමේ බදුදිමේදී ගිවිසුම්ගත කාලය එකිනෙකට වෙනස් වී තිබුණි. | වර්තමානයේදී ආයෝජිත මුදල් වටිනාකම මත පමණක් බදු කාලසීමාව තීරණය කරනු නොලබන අතර අදාල තානායමෙහි සිදුකිරිමට යෝජනා කර ඇති සංවර්ධන කටයුතු හා නවීකරණ කටයුතු වලට අවධානය යොමුකර අදාල සමාගමේ මුල්‍ය තත්ත්වය පදනම් කරගෙන හා තානායම් බදු දීමේදී මින් ඉදිරියට ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පලකර ඒ අනුව කටයුතු කරනු ඇත. | දීර්ඝකාලීන පදනම මත තානායම් බදු දීමේදී විනිවිදභාවයකින් යුක්තව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර බදු දීමටත් එසේ බදු දීමේදී බදු ලබාගන්නා සමාගම්වල පළපුරුද්ද හා මුල්‍යමය හැකියාව පිලිබඳව වැඩි අවධානයක් යොමුකර බදුකරුවන් තෝරාගත යුතුයි. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා රෙස්ට් හවුසස් සමාගම විසින් ඍජුව පාලනය කරනු ලබන මහියංගනය තානායමේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් 2018 වර්ෂයේ මාස 07 ක් සම්බන්ධයෙන් පමණක් ලද තොරතුරු අනුව මෙහෙයුම් අලාභය රු. මිලියන 1.2 ක් ඉක්මවා තිබුණි. මෙම තානායම දිගින් දිගටම මෙහෙයුම් අලාභ මත පවත්වාගෙන ගොස් තිබුණි. | ආරම්භයේ සිටම අළුත්වැඩියා කටයුතු සිදුනොකිරීම හේතුවෙන් තානායම ඉතා අබලන් තත්ත්වයේ පැවතීම, නිසි කළමනාකාරිත් නොමැති වීම හා තානායමේ පවත්වාගෙනයාමේ හා පරිපාලන වැය අධිකවීම හේතු විය. | මහියංගන තානායම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර එකී තානායම ලබන මෙහෙයුම් අලාභ , ලාභයක් බවට පරිවර්තනය කිරිමට අවශ්‍ය කටයුතු කල යුතු වේ. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 | අදහස් දක්වා නැත | සමාගම විසින් පිළීයෙල කරන ක්‍රියා පරිපාටි සහ අනෙකුත් විධි |

| | | |
|---|---|---|
| දිනැති පාලන චක්‍රලේඛය 7.3 වගන්තිය අනුව රාජ්‍ය ව්‍යාපාර , රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ඒ ආකාරයට පිලිපැදිය යුතු වන අතර අනෙකුත් ක්‍රියාපරිපාටි හා විධිවිධාන ආයතනයේ අවශ්‍යතාවලට අනුරුපිව සකස් කරයිනම් ඒ වෙනුවෙන් රේඛිය අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද සමාගම විසින් පිළියෙල කරන ලද ක්‍රියාපරිපාටි හා විධිවිධාන සම්බන්ධයෙන් එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | විධාන සම්බන්ධයෙන් රේඛිය අමාත්‍යාංශය සහ මහභාණ්ඩාගාරයේ ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුයි. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයට අදාලව පහත දැක්වෙන පරිදි නව බඳවාගැනීම් සිදුකර තිබුණද සමාගමකට අදාල අනුමත කාර්යමණ්ඩල විස්තර සහ දක්වා ඇති බඳවාගැනීම් සඳහා වු විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණිග | නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් පරිදි බඳවාගැනීම් සිදුකර ඇත. | සමාගමේ අනුමත තනතුරු සඳහා බඳවාගැනිම් සිදුකල යුතු අතර අනුමත කර නොමැති තනතුරු අනුමත කරගැනීමට කඩිනමින් කටයුතු කල යුතුයි. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක පීඊඩී/12 සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් පරිදි සමාගම විසින් 2018 වර්ෂයට අදාල අවසන් මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් 2019 ජුලි 05 දින මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | පීඊඩී/12 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරිමට පියවර ගත යුතුයි. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොමැත. | සමාගම සම්බන්ධයෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කල යුතුයි. |

**4.3** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොමැත. | සමාගම සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුයි. |

**4.4** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබු අතර නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සමාගමේ කටයුතු විගණනය කිරීමට හැකි වුවද එකී අවස්ථාව සමාගම විසින් ලබාගෙන නොතිබුණි. මෙම නිසා සමාගමේ 2018 සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොමැත. | සමාගමේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැති බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සමාගම සලසා දිය යුතු වේ. |

**4.5** විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු පවත්වා නොතිබුණි. | විගණන කමිටු පවත්වා නැත | විගණන කමිටු පැවැත්වීමට කටයුතු කල යුතු වේ. |

**4.6** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක PED/12 සහ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය එම වර්ෂයට මාස 03 ට පෙර අනුමත කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුමත කර නොතිබුණි. | අයවැය ලේඛනය නියමිත දිනට අනුමත කර නොමැත. | වාර්ෂික අයවැය ලේඛන පිළියෙල කර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරවා ගත යුතුයි. |